# නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

# ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

E-mail : info@cida.gov.lk Website : www.cida.gov.lk

# පුරප්පාඩු

## ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ පහත සඳහන් තනතුරෙහි පවතින පුරප්පාඩුව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ

## කළමනාකරු සේවා කාණ්ඩය - MM 1-1 - II ශ්‍රේණිය

## 1. සහකාර අධ්‍යක්ෂ (මුදල්) - MM 1-1 - II ශ්‍රේණිය - තනතුරු 01

➢ **සුදුසුකම් සහ පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මූල්‍ය / ගණකාධිකරණ / වාණිජ / ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / රාජ්‍ය පරිපාලනය / රාජ්‍ය කළමනාකරණය හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**හෝ**

2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) අන්තර් මධ්‍ය විභාගය හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) / සහතිකලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ (ACCA) I හා II කාණ්ඩයේ විභාග සමත්වී තිබීම.

**සමග**

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක ගිණුම්කරණය හා මූල්‍ය පිළිබඳ අවම වශයෙන් වසර 01 ක විධායක මට්ටමේ තනතුරක සේවා පළපුරුද්ද ලබා තිබීම.

**සටහන :** පරිගණකගත ගිණුම්කරණ කටයුතු පිළිබඳ හැකියාව අමතර සුදුසුකමක් සේ සැලකේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.

කනිෂ්ඨ කළමනාකරු සේවා කාණ්ඩයේ (JM) ගිණුම් නිලධාරී / විගණන නිලධාරී තනතුරේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

2016.01.01 දින සිට වැටුප් කේත අංක සහ වැටුප් පරිමාණ.

MM 1-1 රු. 53,175/- 10 X 1,375/- 15 X 1,910/- = 95,575 /-

**සෑම අයදුම්කරුවෙකුම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.

iii. විශිෂ්ට චරිතයකින් හා ජවයකින් හෙබි විය යුතු ය.

**වයස් සීමාව :**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන්ට සහ දැනටමත් රජයේ / ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන්ට ඉහත සඳහන් උපරිම වයස් සීමාවන් බලනොපායි.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

ලිඛිත තරඟකාරී විභාගය සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් තෝරා ගැනීම සිදු කරනු ලබයි.

**ප්‍රතිලාභ**

➢ ජීවන වියදම් දීමනාව හා රජයේ අනුමත වෙනත් දීමනා.

➢ සේවකයාගේ වැටුප් පදනම් කොටගෙන සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක දායකවීමක් ද, සේවකයාගෙන් 10% ක දායකවීමක් ද සමග ආයතනය විසින් සේවකයා වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3% ක් ද බැර කිරීමක් කරනු ලැබේ.

➢ "අග්‍රහාර රත්" වෛද්‍ය රක්ෂණ පහසුකම්.

➢ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයන්ට අනුකූලව ප්‍රසාද දීමනා ගෙවනු ලැබේ.

➢ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයන්ට අනුකූලව කළමනාකාර මට්ටම සඳහා ප්‍රවාහන පහසුකම් සහ සන්නිවේදන පහසුකම් හා බිල්පත් ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

අයදුම්කරුගේ ජීව දත්ත ඇතුළත්ව, නිසි පරිදි පිළියෙල කරන ලද අයදුම්පත්, අධ්‍යාපන හා වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික කරන ලද සහතික පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත 2024.08.12 දින හෝ ඊට පෙර සභාපති වෙත ලැබීමට සැලැස්විය යුතුය. රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල / ආයතනවල සේවය කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත්, තම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයන් සහිතව, ඔවුන් තෝරා ගත හොත් දැනට දරන තනතුරින් නිදහස් කිරීමට හැකිද යන්න සඳහන් කර එවිය යුතුය. **අයදුම්පත් එවීමේදී ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.**

අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් සපුරා ඇති තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**සභාපති**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**
**"සව්සිරිපාය" 123, විජේරාම මාවත,**
**කොළඹ 07.**